# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

පළමු වාර පරීක්ෂණය - 2019 මාර්තු

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

10 ශ්‍රේණිය                                                                 කාලය පැය 03 යි

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01. පහත සඳහන් සිද්ධිය කියවා අංක (1) සිට (10) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගංගොඩ ග්‍රාමයේ සියලුම ජනයා ගොවීන් වේ. ගමේ පාසලෙන් අධ්‍යාපනය ලබා ශ්‍රී ජයවර්ධනපුර සරසවියට ඇතුලත්ව ව්‍යවසායකත්ව අධ්‍යයනය පිළිබඳ උපාධියක් ලබා ගත් මිනුර ගමේ සිටින එකම උපාධිධාරියා වේ.

මෙම ගමෙහි වෙසෙන ඔහුගේම වයසේ අනෙකුත් තරුණ තරුණියන් නිරෝගී මෙන්ම සුහද ගති පැවතුම් ඇති පිරිසකි. එදිනෙදා කෘෂි කටයුතුවලින් සිය දිවි පෙවෙත ගෙවන මොවුන් රජයේ හෝ පෞද්ගලික ආයතනයක රැකියාවල් ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අතර විරැකියාවෙන් පෙලෙති.

සරසවි අධ්‍යාපනය ලබන කල කොළඹදී ඔහු ලද අත්දැකීමක් වූයේ බොහෝ දෙමාපියන් රැකියාවල නියුක්තවීම මත ඉතා ඉහළ වැටුපක් යටතේ වුව ද සිය මහළු දෙමාපියන් හා කුඩා දරුවන් රැක බලා ගැනීමට විශ්වාසවන්ත සෞඛ්‍යය සම්පන්න පිරිසක් නොමැති වීමයි. ඔහු නවාතැන් ලබා සිටි නිවැසියන්ට ද මෙය බරපතල ප්‍රශ්නයක් වී තිබිණි.

ගමේ සිටින සිය මිතු කැල රැස්කර ගත් මිනුර මෙම රැකියා අවස්ථා පිළිබඳව පැහැදිලි කර, විශ්වාසවන්තභාවය හා කාරුණික සේවයට සෑම විටම මුල් තැන දිය යුතු බවට අවධාරණය කරමින් ''නයිටිංගේල්'' නමින් උපස්ථායක සේවාවක් ආරම්භ කරයි. සේවකයන් අවංකව විශ්වාසනීයව සිය සේවය උපරිම ගුණත්වයෙන් සැපයීම මත ඔහුගේ මෙම ව්‍යාපාරයට ඉතා ඉහළ ඉල්ලුමක් පැවති අතර, ඔහු විශාල ලාභයක් ද මේ වන විට ලබා ඇත. ඉහළ වැටුපක් ලබා දෙන බැවින් දැනට දීප ව්‍යාප්ත මට්ටමින් තරුණ තරුණියන් විශාල පිරිසක් මෙහි සේවය කරති. විශාල පිරිසක් මෙහි ලියාපදිංචි වෙමින් සිටී.

මේ වන විට ආයතනය ඉතා පුළුල් බැවින් මෙහි කළමනාකරණ කටයුතු සඳහා පුද්ගලයින් කිහිප දෙනෙකු සම්බන්ධ කර ගැනීම ඔහුගේ අපේක්ෂාව වන අතර එමගින් පුළුල් ව්‍යාපාර සංවිධාන වර්ගයක් ඉදිරියේ දී ආරම්භ කිරීමට ඔහු අදහස් කරයි.

(1) මිනුරගේ ''නයිටිංගේල්'' ව්‍යාපාරයේ ඉලක්ක දෙකක් හා අරමුණක් සඳහන් කරන්න.

(2) (අ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයන් 3 ක් නම් කරන්න.
(ආ) මෙම ඇල්මැති පාර්ශවයන් ව්‍යාපාරයෙන් බලාපොරොත්තු වන අපේක්ෂාවන් එක බැගින් දක්වන්න.

(3) (අ) මෙම ව්‍යාපාරය ලියා පදිංචි කළ යුතුද ?
(ආ) එසේ නම් එයට හේතු වූ කරුණ කුමක්ද ?
(ඉ) එසේ ලියාපදිංචි කළ යුතු නම් අදාල පනත ලියා දක්වන්න.

(4) මෙම ව්‍යාපාරයේ අවස්ථා හා ශක්තීන් දෙක බැගින් වෙන වෙනම ලියන්න.

(5) ඉහත සිද්ධියට අදාල ආර්ථික පරිසර සාධකයක් දක්වන්න.

(6) හිමිකාරත්වය හා අරමුණ මත මිනුරගේ ව්‍යාපාරය අයත් වනුයේ කවර ව්‍යාපාර සංවිධානයකට ද යන්න වෙන වෙනම දක්වන්න.

(7) (අ) නයිටිංගේල් ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි හා අවාසි දෙක බැගින් ලියන්න.

(8) මෙම ව්‍යාපාරයේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ඔහුට ලබාගත හැකි වාසි කවරේ ද ?

(9) ඔහුගේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට අදාල බලධරයා නම් කරන්න.

(10) ''ව්‍යාපාරය පුළුල්වත්ම සිය ව්‍යාපාර කටයුතු සඳහා කළමනාකරුවන් කිහිප දෙනෙකු සම්බන්ධ කර ගැනීමට ඔහු අදහස් කරයි''

(අ) මේ සඳහා ඔහුට ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ග මොනවාද ?

(ආ) ඉන් එක් ව්‍යාපාර සංවිධානයක වාසීන් දෙකක් සඳහන් කරන්න.

[ලකුණු 2 x 10 = 20]

02. වීර පරාක්‍රමබාහු විදුහලේ 3 ශ්‍රේණියේ සිසුන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථයකින් විනෝද චාරිකාවක් සංවිධානය කර ඇත. චාරිකාවට සහභාගි වන සියලුම සිසුන් පාසල් නිළ ඇඳුමින් සැරසී පැමිණිය යුතු බවත්, සිසුන්ගේ ආරක්ෂාවට යන මව්වරුන් සාරියකින් සැරසී පැමිණිය යුතු බවත් විදුහල්පතිතුමිය උදෑසන රැස්වීමේ දී දන්වා ඇත.

(i) (අ) ඉහත ඡේදයේ සඳහන් වන අවශ්‍යයතා තුනක් සඳහන් කරන්න.

(ආ) ඔවුන් එම අවශ්‍යයතා සපුරාගෙන ඇත්තේ කෙසේ ද ?

(i) තාක්ෂණයේ දියුණුව නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම් වලට අදාල නිදසුන් දෙකක් ලියන්න.

(ii) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරය තුලින් ඇතිවන හිතකර බලපෑම් මොනවා ද?

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද දක්වන්න.

(අ) භාණ්ඩ හා සේවා වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේ දී පාරිභෝගික සමාජ තත්ත්වය සැලකිල්ලට ගනු ලබයි.

(ආ) එකම අවශ්‍යතාවය සඳහා විවිධ සන්නම් නාම වෙළෙඳපොළට ඉදිරිපත් කරයි.

(ඉ) ඇල්මැති පාර්ශව යන්නෙහි අදහස ව්‍යාපාරයට කැමැත්තක් දක්වන පාර්ශව යි.

(ඊ) ව්‍යවසායකයන් නව්‍යතා සම්පාදනය කල ද අවධානම් නොදරයි.

(iv) රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තු අතර පවතින වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

[ලකුණු 2 x 5 = 10]

03. (i) රටක පවතින උද්ධමනකාරී තත්වය එරට ඉතුරුම්වලට බලපාන්නේ කෙසේද ?

(ii) ව්‍යාපාරයක කළමනාකරුවෙකුගේ අරමුණු දෙකක් ලියන්න.

(iii) ඔබ ප්‍රදේශයේ පවත්නා භාණ්ඩ නිෂ්පාදන ආයතනයක් හා සේවා සපයන ආයතන දෙකක් නම් කරන්න.

(iv) ''සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා ශ්‍රමය බහුල වශයෙන් යොදාගන්නා බැවින් රජය සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත දිරි ගැන්වීමට බදු සහන දෙනු ලබයි''

(අ) ''ශ්‍රමය'' යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

(v) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද දක්වන්න.

(අ) ව්‍යාපාර අවධානම් දරමින් නව්‍යතා සම්පාදනය කරමින් තීරණ ගන්නා ව්‍යාපාරයේ අයිතිකරු වේ.

(ආ) ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලුම සම්පත් භූමිය ලෙස හැඳින්විය නොහැක.

(ඉ) පරිසරවේදීහු හා ජනමාධ්‍යවේදීහු ප්‍රජා පරිසරයට අයත් වෙති.

(ඊ) වුවමනා අසීමිත වීමට හේතුව අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම විවිධ වුවමනා මගින් සිදුවීමයි.

[ලකුණු 2 x 5 = 10]

04. (i) ''ව්‍යාපාරිකයන්ට වැදගත් වනුයේ අවශ්‍යතා නොව වුවමනාවන්ය.''
මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද දක්වන්න.

(අ) හවුල් ව්‍යාපාරවල නීතිමය කටයුතුවලදී හවුල්කරුවන් සිය පෞද්ගලික නම්වලින් පෙනී සිටියි.

(ආ) නිරන්තර පරිසර අධ්‍යයනය ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීමට හේතු වේ.

(ඉ) තාක්ෂණික දැනුම යාවත්කාලීන නොවීම ව්‍යාපාරවලට තර්ජනයකි.

(ඊ) ගෝලීයකරණය මිනිසුන් අතර ඇති දුර ප්‍රමාණය වර්ධනයට හේතුවක් වී තිබේ.

(iii) පූර්ණ සේවා නියුක්තිය යන්නෙන් අදහස් කරනුයේ කුමක්ද ?

(iv) අරමුණ අනුව ව්‍යාපාර වර්ගීකරණය ගැලීම් සටහනක් මගින් පෙන්වන්න.

(v) ව්‍යාපාරවල නෛතික පරිසරයට සම්මත අණපනත් හා නීතිරීති ඇතුලත් කර ඇත. ව්‍යාපාරික නෛතික පරිසරයට අදාලව පැවති සම්මත අණපනත් හා නීතිරීති ඇතුළත් කිරීමට හේතු වන කරුණු මොනවාද ?

[ලකුණු 2 x 5 = 10]

05. ''ඇල්මැති පාර්ශවයක් ලෙස රජය ව්‍යාපාරවලින් ද ව්‍යාපාර රජයෙන් ද යම් යම් දෑ අපේක්ෂා කරනු ලබයි''

(i) එසේ ඇල්මැති පාර්ශවයක් ලෙස රජය ව්‍යාපාරවලින් ද ව්‍යාපාර රජයෙන් ද බලපොරොත්තු වන දෑ වෙන වෙනම දක්වන්න.

(ii) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැක. ඒ සඳහා යොදා ගත හැකි නිර්ණායක 4 ක් ලියන්න.

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ග්‍රාම නිලධාරී මහතාගෙන් අයදුම්පතක් ලබාගත යුතුයි.

(ආ) කළමනාකරණය යනු ව්‍යාපාරයක සම්පත් සැලසුම් කිරීම, සංවිධානය මෙහෙයවීම හා පාලනය යි.

(ඉ) දෙපාර්තමේන්තුවල අයිතිය සම්පූර්ණ වශයෙන් රජය සතු වේ.

(ඊ) සමූපකාර සමිති ව්‍යාපාර පෞද්ගලික අංශයට අයත් බැවින් රාජ්‍ය අනුග්‍රහය හිමි නොවේ.

(iv) ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහා අදාල වන ක්‍රියා පටිපාටිය දක්වන්න.

(v) ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරයේ අගය ඉහළ යාම ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ට තර්ජනයක් හා අවස්ථාවක් වන ආකාරය නිදසුන් දෙකක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 x 5 = 10)